# කලුතර දිස්ත්‍රික්කයේ දියගම ගිරි ලිපිය හා බැඳුණු ජනප්‍රවාදයන්

ආර්. එල්. ඩී. රසාදිකා

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
dilhanirasadika123@gmail.com

---

කලුතර දිස්ත්‍රික්කයේ කලුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියගම ග්‍රාම සේවා වසමේ පැලුණු ගල තොටුපල අසල පර්යේෂණයට බඳුන් වූ ගිරි ලිපිය පිහිටා තිබේ. කලුගඟ අසබඩ පිහිටි පස්යොදුන් රට ඉපැරණිම ගිරි ලිපිය වන දියගම ගිරි ලිපිය හා බැඳුණු ජනප්‍රවාදයන් හා විශ්වාසයන් පිළිබඳව විමසා බැලීම මෙහි අරමුණ විය. මෙම පර්යේෂණය සඳහා ලිඛිත මූලාශ්‍රය පරිශීලනය සහ ක්ෂේත්‍රගත පෞද්ගලික සම්ප්‍රේෂණ හරහා ජනප්‍රවාද විමසා බැලීම සිදු කරනු ලැබිණි. මෙම ලිපිය හා බැඳෙන එක් ප්‍රකට පුරාවෘත්තයක් සහ තවත් පුරාවෘත්ත කිහිපයක් පවතින බව ක්ෂේත්‍ර කටයුතුවලදී හඳුනාගනු ලැබිණි. ගිරි ලිපියෙහි අර්ථ හා සසඳා බැලීමේ දී මෙම පුරාවෘත්ත සාධනය වන කිසිදු කරුණක් එහි දක්නට නොලැබේ. තව ද මෙම ලිපිය හා බැඳෙන පුරාවෘත්ත සියල්ලම පාහේ වස්තු සම්පත් පදනම් කරගත් ඒවා වන හෙයින් ලිපිය තදාශ්‍රිත කලාපවල උරුම විනාශයට ද එම පුරාවෘත්ත හේතු වී තිබේ.

ප්‍රමුඛ පද : දියගම ගිරි ලිපිය, පුරාවෘත්ත, නිදන්